# අංකෙන්ද ශාකය හා බැඳි දේශීය කැඩුම් බිඳුම් වෙදකම

පාරම්පරික වෛද්‍ය ඩී.ආර් ලියනපතිරණ

අංකෙන්ද යනු රුටේසීය කුලයට අයත් ශාකයකි. එය ලංකාවේ අධික ශීතල නොවූ සියලු ම ප්‍රදේශයන්හි වැවේ. මෙම ශාකයේ ප්‍රභේද දෙකකි. එක් වර්ගයක් අඟල් 6-7ක් දිගින් යුතු තරමක් විශාල පත්‍රයක් සහිත වන අතර අනෙක් වර්ගය අඟල් 3-4ක් දිගින් යුතු නාරටිය ළා කහපාට වර්ගයකි. මෙම වර්ග දෙකෙහි ම ගුණ සමානය. මුල් හා බීජ මගින් ශාක ව්‍යාප්තිය සිදුවේ.

මෙම ශාකය ඖෂධීය කර්මයන් සඳහා මෙන් ම විවිධ වූ කර්මාන්ත සඳහා ද යොදාගෙන ඇත. සමහර පළාත්වල කිතුල් දිය පැසීම වැළැක්වීම සඳහා වියළාගත් අංකෙන්ද පොතු භාවිතයට ගනී. මෙම ශාකය කැඩුම් බිඳුම් වෙදකම සඳහා පමණක් නොව ගෙඩි, වණ, කුෂ්ට වෙදකමේ දීත් බහුල ව යොදා ගනී. මෙම ශාකය ප්‍රයෝග කොට සංස්කරණය කළ ඖෂධ අතර පත්තු, මැල්ලුම්, ලේපන, පැලැස්තර හා තෙල්කිරි යනාදිය වේ. මෙම ඖෂධ සැකසීමේ දී අංකෙන්ද ශාකයේ කොටස් ඒ අයුරින් ම භාවිතයට ගනී.

වැටීම්, ගැටීම්, පහර වැදීම් ආදී තත්ත්වයන් නිසා අප සිරුරේ පටක හා මාංශ පේශී තැලී පසුව ඝන වී නිසි ප්‍රතිකාරයක් සිදු නොවුනහොත් නිල් වී තද වීම හෙවත් ගල් වීම සිදුවේ. මෙකී තත්වය කටවහරේ දී "ලේ බැසීම" යන්නෙන් අදහස් කෙරේ. මෙකී තත්වයන් ට නිසි ආකාර ව ප්‍රතිකාර නොකළ විට ඒවා සුවවීමට කල් ගතවේ. මෙවැනි තත්ත්වයන්වල දී අංකෙන්ද ශාකය භාවිත කොට අප පරපුර විසින් සිදුකරනු ලබන හස්තසාර ප්‍රතිකාර විධි කිහිපයක් මෙසේ දැක්විය හැක.

උස් ස්ථානයන්ගෙන් (ගස් ආදියෙන්) වැටී නිසි ප්‍රතිකාර නොලැබ අසරණ වන රෝගීන් බොහෝමයක් අද සමාජයේ බහුල ව දක්නට ලැබේ. මෙවැනි අවස්ථාවන්හි දී එම රෝගීන්ගේ මළ මුත්‍ර ඇහිරී තිබුණ විට ප්‍රථමයෙන් අංකෙන්ද කොළ, තැඹිලිපොල් සමග කොටා හීනැටි හාල් මිශ්‍ර කොට කැඳ පිස දීම කරනු ලබයි. පැය 2-3ක් ගතවන විට රෝගියාට මනා සැහැල්ලුවක් ලැබේ.

එවැනි රෝගීන් තැබීම සඳහා ම වෙනිවැල් තීරු ඉරා අංකෙන්ද පොතුවලින් සකස් කළ අඩි 6×3 දිග පළලින් යුත් බෙහෙත් ඇඳක් අප පරම්පරාව සතු වේ. එහි රෝගියා ව තබා ගෙලෙහි සිට පාදාන්තය දක්වා ම අඟල් 1-2 ඝනකමින් යුතු ව මැල්ලුම තබා රෝගියා වෙළන්නේ අංකෙන්ද කොළ, පොතු, මුල්, මල් ආදී දේ මුල් කොට ගනිමිනි. මෙය දිනපතා ම කළ යුතු අතර දින 7-8ක් ගත වන විට රෝගියා ස්වොත්සාහයෙන් ම නැගිටින්නේ හෙළ වෙදකමෙහි හාස්කම් පාමිනි.

නොනවතින දරුණු හිසරදය සඳහා ළපටි අංකෙන්ද කොළ, කෝමාරිකා යුෂ, තැඹිලිපොල් කොටා හොඳින් මිශ්‍රකර පෙරා රෝගියාගේ හිසට දමා විනාඩි 05ක් පමණ හොඳින් සම්භාහනය කිරීමෙන් නැවත හිසරදය ඇති නොවන ලෙසට ම සුව වේ.

මේ ආදී ලෙස අංකෙන්ද විශාල රෝග පරාසයක භාවිත කළ හැකි ඉතා වටිනා හෙළ ඔසුවකි.